2nd International Conference of Multidisciplinary Approaches (iCMA), 2015
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka

ISSN: 2386 – 1509
Copyright © iCMA


# කමත් යන්ත්‍ර : වී ගොවිතැනෙහි අභිචාරාත්මක දෘශ්‍ය කලාව

1 කුසුම්සිරි කොඩිතුවක්කුල 2 තිස්ස වීරසේකර, 3 වසන්ත දිසානායක

*1. පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට*

*විශ්වවිද්‍යාලය මිහින්තලේ. කෞතුකාගාර පාලක, සීගිරිය කෞතුකාගාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල සීගිරිය.*

*2. සාමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මිහින්තලේ*

*3මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මිහින්තලේ*

kusumsiriko@gmail.com

කමත ශ්‍රී ලාංකේය කෘෂි සංස්කෘතිය තුළ සුවිශේෂී උප සංස්කෘතියක් විද්‍යාමාන කරනු ලබන ස්ථානයකි. ඊට ආවේනික වූ අභිචාර විධි හා ජනවහර කමත කෙරෙහි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි පැවති ගෞරවය හා පූජනීයත්වය මනාව ස්ඵුට කරයි.

කමත හා සම්බන්ධ අභිචාර විධි අතර අළුවන් වැඩීම සුවිශේෂී වේ. කොළ පෑගීමට පෙර කමත මධ්‍යයේ වූ '' අරක් වළෙහි '' අරක් වස්තු ( ආරක්ෂක වස්තු) තැන්පත් කිරීමෙන් අනතුරුව ඒ කේන්ද්‍ර කොට ගෙන අළුවලින් ''කමත් යන්ත්‍ර'' ඇඳීමක් සිදු කරයි. හින්දු ගොවීන් අතර මෙවැනි චාරිත්‍රයක් හඳුනාගත නොහැකි වුවත් ඇතැම් මුස්ලිම් ගොවීන් අතරෙහි ''කාවල් '' නමින් මෙවැනි යන්ත්‍ර ඇඳීමක් සිදු කෙරේ.

කමත් යන්ත්‍ර ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධාකාර ලෙස භාවිතයට ගැනේ. එය පොදු මූලික ආකෘතියකින් යුතු වුවත් භාවිතයට ගනු ලබන සංකේත හා හැඩවල ප්‍රදේශීය විෂමතා හඳුනාගත හැකිය. අනුරාධපුර, කුරුණෑගල, කෑගල්ල යන දිස්ත්‍රික්කවල සිදුකරනු ලැබූ ක්ෂෙත්‍ර අධ්‍යයන මගින් ලබා ගන්නා ලද දත්ත මෙම පර්යේෂණය සඳහා පාදක කර ගන්නා ලදි. ඒ අනුව ශ්‍රී ලාංකේය සමාජයෙන් ගිළිහී ගිය සුවිශේෂී ජන උරුමයක් මෙන්ම අභිචාරාත්මක කලාවක් ද වන කමත් යන්ත්‍ර වාර්තාගත කිරීම හා ඒවායේ යථෝක්ත ප්‍රදේශීය විෂමතා හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

කමත් යන්ත්‍ර ප්‍රාදේශීය වශයෙන් විවිධාකාර වුවත් එය පොදු මූලික ආකෘතියකින් සමන්විතය. කවාකාර හා සිව්රැස් යන දෙහැඩයට ම කමත් යන්ත්‍ර අඳිනු ලැබුවත් බහුතරය කවාකාර හැඩැති ය. කවාකාර කමත් යන්ත්‍ර ඒක කේන්ද්‍රිය කව තුනකින් හෝ හතකින් සමන්විතවන අතර ඊට වෙනස් කව සංඛ්‍යාවලින් යුතු යන්ත්‍ර ද කලාතුරකින් දැකිය හැකි ය. වෘත්ත සීමාවෙන් පිටතට යන පරිදි සිව් දෙසට විහිදුනු ත්‍රිශූල හතරක් ද කමත් යන්ත්‍රයට අයත් ය. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල භාවිත කමත් යන්ත්‍ර විමසා බැලීමේදී ඒවායේ අන්තර්ගතය අනුව ප්‍රභේද කිහිපයකින් හඳුනාගත හැකි ය. එනම් වෘත්ත හා ත්‍රිශූල පමණක් සහිත,ගාථා, මන්ත්‍ර පාඨ සහ වදන් සහිත, ගොවි උපකරණ සහිත, සුභ සංකේත සහිත දුනු, හී, කඩු වැනි අවි සහිත, හා සියළු සංකේත සංකලනය වූ යන්ත්‍ර වශයෙනි.

පොදුවේ ගත් කළ කමත් යන්ත්‍රය අස්වැන්නෙහි ආරක්ෂාව පතා නිර්මාණය කරන ලද්දක් බව පැහැදිළිය. මෙම කමත් යන්ත්‍ර සඳහා භාවිත සියළු සංකේත ආරක්ෂාව සහ ගොවිතැනෙහි ගෞරවය සංකේතවත් කරයි.

ප්‍රමුඛ පද- වී ගොවිතැන, කමත, කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අභිචාර, කමත් යන්ත්‍ර, අභිචාරාත්මක කලා